**සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා**
**චක්‍රලේඛ ලිපි අංක ඃ 06/2008**

මගේ අංකය ඃ- රාසේකො 12/1/10
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
පළාත් සභා සංකීර්ණය
නව නගරය, රත්නපුර
2008.03.

සබරගමුව පළාතේ,
01. සෞඛ්‍ය ලේකම්
02. පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ
03. ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, රත්නපුර/ කෑගල්ල
04. සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සියළුම ආයතන ප්‍රධානීන් වෙත,

**සබරගමුව පළාත් සභාවේ සෞඛ්‍ය දේශීය වෛද්‍ය සමාජ සුභසාධන හා ළමාරක්ෂණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරී තනතුර සඳහා අයදුම්පත් කැඳවීම**

සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරී තනතුරේ පවත්නා පුරප්පාඩුව (01) සඳහා පහත දැක්වෙන සුදුසුකම් ඇති නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. එබැවින් මෙම චක්‍රලේඛය ඔබ ආයතනයේ සිටින අදාල සියළුම නිලධාරීන්ගේ අවධානයට යොමු කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

01. වැටුප ඃ- රු. **14930-7×150-9×240-10×290-15×320-25840/-**
(රා.පරි.චක්‍රලේඛ 6/2006 අනුව එම්ටී-06-2006)

02. වයස් සීමාව ඃ-
වයස අවුරුදු 18 ට වැඩි හා 45 ට අඩු විය යුතුය. දැනටමත් සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.

03. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් ඃ-

I. පශ්චාත් උපාධි/ඩිප්ලෝමා රහිත

අ. රාජකීය සෞඛ්‍ය සංගමයේ (එංගලන්තය) මහජන සෞඛ්‍ය පරීක්ෂක සහතිකය /හෝ කළුතර ජාතික සෞඛ්‍ය විද්‍යායතනයෙ ඩිප්ලෝමා සහතිකය/ හෝ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ හෙදකම පිළිබඳ ප්‍රවීනතා සහතිකයක හෝ පවුල් සෞඛ්‍ය සේවිකාවක් වශයෙන් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී ඇති සහතිකය හෝ ළමා දන්තාරක්ෂාව පිළිබඳ නිවාරක හා ශල්‍ය සිද්ධාන්ත සහ ශිල්පන න්‍යාය විෂයක ප්‍රවීනත්ව සහතිකයක් ලබා තිබීම.

සහ

ආ. පිළිගත් විශ්ව විද්‍යාලයකින් විද්‍යා හෝ කලා විෂයයන්ගෙන් උපාධි සහතිකයක් ලබා තිබීම සහ පූර්ණකාලීන සෞඛ්‍ය අධ්‍යයන කටයුතු වල එක් අවුරුදු පළපුරුද්දක් තිබීම.

II. පශ්චාත් උපාධි ශාස්ත්‍රපති හෝ ඩිප්ලෝමා සහිත ඉහත 3.1 'අ', 'ආ' සුදුසුකම් වලට අමතරව පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් සෞඛ්‍ය අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් ශාස්ත්‍රපති උපාධියක් හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම.

04. බඳවා ගන්නා ක්‍රමය ඃ-
ඉහත සුදුසුකම් ඇති දෙපාර්තමේන්තු සේවකයින්ගෙන් බඳවා ගැනීම් කෙරේ. එසේ බඳවා ගැනීමට සුදුසුකම් ඇති සේවකයින් නොමැති වුවහොත් රා.පරි.චක්‍රලේඛ අංක 15/90 හා එයට අදාලව පනවනු ලැබිය හැකි සංශෝධනයන්ට යටත්ව බාහිර අයදුම්කරුවන්ගෙන් බඳවා ගැනීම් කරනු ලැබේ.

සුදුසුකම් ලත් අයදුම්කරුවන් අනුමත කළ ලකුණු දීමේ ක්‍රමයක් පදනම් කර ගත් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගන්නා අතර එම ලකුණු දීමේ පදනම පහත දැක්වේ.

| | ලකුණු ප්‍රමාණය |
|---|---|
| 01. සම්මුඛ පරීක්ෂණය | 10 |
| 02. පූර්ණ කාලීනව සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරියෙකුගේ වැඩ ආවරණය කිරීම( එක් අවුරුද්දකට වඩා වැඩි අවුරුද්දක් සඳහා ලකුණු 05 බැගින් උපරිම ලකුණු 25) | 25 |
| 03. I. පිළිගත් විශ්ව විද්‍යාලයක පශ්චාත් උපාධියක් හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහතිකය - 20<br>II. සමාජසේවා විද්‍යාලයෙන් සමාජ සේවා පිළිබඳ ඩිප්ලෝමා සහතිකය හෝ පිළිගත් ආයතනයකින් ලබා ඇති ඊට සමාන ඩිප්ලෝමා සහතිකය - 10 | උපරිම 20 |
| 04. පර්යේෂණ හා අධ්‍යයනයන් සඳහා ඃ-<br>විෂයයට අදාලව තමන් විසින් කරන ලද පර්යේෂණ හා ප්‍රකාශන සඳහා එකකට ලකුණු 05 බැගින් | උපරිම 15 |
| 05. සෞඛ්‍ය අධ්‍යාපනය පිළිබඳ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම<br>I. ජාතික මට්ටමේ ඇගයීමට ලක්වූ ව්‍යාපෘති වලට ක්‍රියාකාරී දයකත්වය ලබාදීම සඳහා එක් ව්‍යාපෘතියකට ලකුණු 05 බැගින්<br>II. පළාත් මට්ටමේ ඇගයීමට ලක්වූ සෞඛ්‍ය ව්‍යාපෘති සඳහා එක් ව්‍යාපෘතියකට ලකුණු 03 බැගින්<br>III. දිස්ත්‍රික් මට්ටමේ ඇගයීමට ලක්වූ ව්‍යාපෘති සඳහා එක් ව්‍යාපෘතියකට ලකුණු 02 බැගින් | උපරිම 15 |
| 06. භාෂා ප්‍රවීණතාවය ඃ-<br>මව් භාෂාව හැර වෙනත් භාෂාවකින් වැඩ කිරීමේ හැකියාව සඳහා එක් භාෂාවකට ලකුණු 05 බැගින් | 15 |
| | 100 |

05. ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 10 සිට 12 වගන්ති අදල වේ.

දැනටමත් සබරගමුව පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව යටතේ සේවයේ නියුතු අයගේ අයදුම්පත් අදළ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ මාර්ගයෙන් අයදුම්කරුවන්ගේ පෞද්ගලික ලිපිගොනු පරීක්ෂා කර බලා අදල තොරතුරු නිවැරදි බවට සහතික කර 2008.04.30 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතුය.

බන්දුල ඒ. නාගසිංහ
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත

පිටපත ඃ- 01. ප්‍රධාන ලේකම්, ස.ප.ස - දැ.පි.